# ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
# බඳවා ගැනීම්

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ දැනට පුරප්පාඩු වී පවත්නා ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමට, සුදුසුකම් ඇති ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. පොදු සුදුසුකම්**

(i) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(ii) උසාවියකින් වරදකරුවකු වී දඬුවම් ලැබුවකු නොවිය යුතුය.
(iii) අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන විට,
ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී - වයස අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි;
(රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවකයන් සඳහා සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ)
(iv) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**02. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි**

මෙම තනතුර ස්ථිරය. පත්වීම ලැබූ දින සිට අවුරුදු 3ක පරිවාස කාලයකට යටත් වේ. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත වේ. රජය විසින් පනවනු ලැබ ඇති සහ වරින් වර පනවනු ලබන පොදු නීති, කොන්දේසි සහ නියමයන්ට යටත්ය. සේවා අවශ්‍යතාව මත විධිමත් ක්‍රමවේදයක් අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**03. තනතුරට අදාල තොරතුරු**

| | |
|---|---|
| 3.1 තනතුරු නාමය<br>3.1.1 වැටුප් පරිමාණය<br>3.1.2සුදුසුකම් | **ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී**<br>AR2-2016 (76,200-2,000x10-96,200/-) රාජ්‍ය කළමනාකරණ සේවා 02/2016(1) චක්‍රලේඛය පරිදි ක්‍රියාත්මක වේ.<br>**බාහිර අයදුම්කරුවන්**<br>(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යා ක්ෂේත්‍රයක පළමු පන්තිය හෝ දෙවන පන්තිය (ඉහළ) සාමාර්ථයක් සහිතව උපාධියක් ලබා තිබීම. (අධ්‍යාපනවේදී උපාධිය තිබීම විශේෂ සුදුසුකමකි.)<br>හෝ<br>(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යා ක්ෂේත්‍රයක දෙවන පන්තිය (පහළ) සාමාර්ථයක් සහිත සිව් අවුරුදු විශේෂ උපාධියක් ලබා තිබීම හා එක වසරක පර්යේෂණ පශ්චාත් උපාධියක් ලබා තිබීම. (අධ්‍යාපන ක්ෂේත්‍රෙය් පර්යේෂණ පශ්චාත් උපාධිය තිබීම විශේෂ සුදුසුකමකි.)<br>හෝ<br>(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සංඛ්‍යානය, කළමනාකරණය, සමාජ විද්‍යා ක්ෂේත්‍රයක සාමාන්‍ය උපාධියක් හා වසර දෙකක පර්යේෂණ පශ්චාත් උපාධියක් ලබා තිබීම.<br>සමග<br>ප්‍රථම උපාධියෙන් පසු වසර 08ක අධ්‍යාපන පර්යේෂණ පළපුරුද්ද |

| | |
|---|---|
| | (iv) ඉහත උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණයන්ට හැර වෙනත් ඉටු කර ඇති පර්යේෂණ/සමීක්ෂණ සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.<br><br>**අභ්‍යන්තර අයදුම්කරුවන්**<br>(අ) (i) පිළිගත් විශ්වවිද්‍යාලයක පශ්චාත් උපාධියක් හෝ පශ්චාත් අධ්‍යාපන ඩිප්ලෝමාවක් සමත්ව තිබීම.<br>හෝ<br>(ii) අදාළ ක්ෂේත්‍රයෙහි දර්ශනපති, විද්‍යාපති පශ්චාත් උපාධි සුදුසුකම් සහිත අධ්‍යාපන/පර්යේෂණ සේවා ගණයෙහි වසර දහයක (10) පළපුරුද්ද<br>හෝ<br>(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලය උපාධිය පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ සාමාර්ථයක් සමග ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී තනතුරෙහි වසර 15කට වැඩි පළපුරුද්දක් තිබීම.<br>(ආ) සේවා කාලය තුළ ඉදිරිපත් කරනු ලැබ ඇති පර්යේෂණ පත්‍රිකා, සංකල්ප පත්‍රිකා ප්‍රකාශන අතිරේක සුදුසුකමක් සේ සලකනු ලැබේ. |

අයදුම්කරුවන් මෙහි පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2017.04.14 දින හෝ ඊට පෙර ලැබෙන සේ සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, අංක 126, නාවල පාර, නුගේගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. අසම්පූර්ණ අයදුම්පත් හා නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

දැනටමත් රාජ්‍ය/ අර්ධ රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

මෙම දැන්වීමට අනුව ඇබෑර්තු පිරවීමට, නොපිරවීමට හෝ ඇබෑර්තුවලින් කොටසක් පමණක් පිරවීමට සම්පූර්ණ බලතල ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව සතුවේ.

අපේක්ෂිත මූලික සුදුසුකම් සපුරා ඇති අය පමණක් අදාළ බඳවා ගැනීමේ ක්‍රමවේදය අනුව සලකා බැලේ.

*සැලකිය යුතුයි. - ආයතනය දැනට අංක 126 නාවල පාර, නුගේගොඩ යන ස්ථානයේ ස්ථාපනය කර ඇති අතර ශාඛා කාර්යාල නොමැත.

මෙම නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පලකර ඇත. භාෂා අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක
සභාපති
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

# ආදර්ශ අයදුම් පත්‍රය

## ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී තනතුර සඳහා අයදුම් පත්‍රය

(01) 1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම:...........................................

1.2 මුලකුරු සමග නම:...........................................

(2) ස්ථිර ලිපිනය:...........................................

(3) දුරකතන අංකය : ...........................................

(4) ජාතික හැඳුනුම්පත් අංකය:....................................

(5) 5.1 උපන් දිනය: වර්ෂය .................. මාසය ................. දිනය ...................

5.2 අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට වයස: වර්ෂ............... මාස ............ දින ...............

(6) ස්ත්‍රී/පුරුෂ භාවය:.................................

(7) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ උපතින් ද, ලියාපදිංචියෙන් ද යන වග :...............................

(8) අධ්‍යාපන සුදුසුකම්

8.1 ප්‍රථම උපාධියේ විස්තර :

උපාධියේ නම :

උපාධිය ලැබූ විශ්වවිද්‍යාලය:

උපාධිය බාහිර/අභ්‍යන්තර ද යන වග:

| උපාධිය ලැබූ වර්ෂය හා මාධ්‍යය | උපාධි විෂයයන් | පන්ති සාමාර්ථය (ඉහල/පහල) |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

8.2 පශ්චාත් උපාධි පිළිබඳ විස්තර:

උපාධියේ නම :

උපාධිය ලැබූ විශ්වවිද්‍යාලය/ආයතනය:

| උපාධිය ලැබූ වර්ෂය හා මාධ්‍යය | උපාධි විෂයයන් | පර්යේෂණ උපාධියක් ද යන වග | පර්යේෂණ නිබන්ධනය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(9) වෙනත් සුදුසුකම්:

.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................

(10) වෘත්තීය සුදුසුකම්:

.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................

(11) සේවා පළපුරුද්ද (අධ්‍යයන/ හා පර්යේෂණ)

.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................

(12) මෙහි සඳහන් කර ඇති සියලු තොරතුරු මගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීම ඇතුළු දඬුවම්වලට යටත් වන බව මම දනිමි.

.....................................          ...............................................

දිනය          අයදුම්කරුගේ අත්සන

(13) දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

....................................................... මයා/මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ ........................... වශයෙන් සේවය කරයි. ඔහු/ඇය ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි වන අතර ඉල්ලුම් කරන තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට භාජනය වී නොමැත. මෙම අයදුම්පත නිර්දේශ කර/නොකර ඉදිරිපත් කරමි.

.............................................          .............................................................

දිනය          අත්සන හා නිල මුද්‍රාව